# සුනඛයින්ගේ වීරකම



## රනුදි නෙතුම්සා

# සුනඛයින්ගේ වීරකම

**රණුදි නෙතුමිසා** (කතෘ)

## කතෘගේ වෙනත් කෘති

- නැති වුණු කිටි පැටියා
- මගෙ සුරතල් බලුපැටියා
- පිට සක්වලයෙක් ඇවිත්

**පාසල** - මහාමායා බාලිකා විදුහලෙ

**ඉගෙනුම ලබන පංතිය** - 7 C

**කෘතිය පළ කරන දිනය** -2026.05.10

ISBN -978-624-211-438-5

පිදුම

අකුරු කරන්නට මඟ කියාදෙන

මහමායාවේ

ගුරු මව් පියවරුනට

සෙනෙහසින් පිළිගන්වමි....

# පෙරවදන

# මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිනියගේ ප්‍රකාශය



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

**<u>සුභාශිංසන පණිවුඩය</u>**

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

## සුනඛයින්ගේ වීරකම

චීනයේ ලියන්හු නම් ලස්සන කුඩා ගමක් තිබුණා. මේ ගම වටා සුන්දර දිය ඇලි සහ කඳු බෑවුම් තිබුණා. මේ ගමේ චෙන්මින් නම් මිනිසෙකු ජීවත් වුණා.

මෙම ගමේ විශේෂම දෙය වුණේ හත් දෙනෙකුගෙන් යුතු බල්ලන් කණ්ඩායමක් ඔහුට සිටීමයි. ගමේ හැමෝම මිනිසුන් ඒ සුනඛයින්ට හුරුබුහුටි, ආදරණීය, සහ ඉතා විශ්වාසවන්ත සත්වයන් ලෙස සැලකුහ. ඔවුන්ගේ නාම වූයේද **Xiao Hei, Bai Bai, Huang Huang, Duo Duo, Lan Lan, Mei Mei**, සහ **Long Long**.



ඔවුන් හැමෝම වෙනස් වුණත් එකට සිටින විට ඔවුන්ගේ ශක්තිය අසමසමයි.

Xiao Hei කණ්ඩායමේ නායකයා වුණා උෟ බුද්ධිමත් වේගවත් සහ අවදානමක් හඳුනාගැනීමට දක්ෂයි Bai Bai සුදු පැහැති හරිම මෘදු සහ මිතුරන්ට හිතවත් බල්ලෙක් Huang Huang කහ පැහැති ශක්තිමත් සහ නිර්භීත බල්ලෙක්. Duo Duo නම් බල්ලා කුඩා වුණත් සතුටු සිනහවෙන් පිරුණු බල්ලෙක්. Lan Lan සන්සුන් විචාරශීලී බල්ලෙක්. Mei Mei හරිම කරුණාවන්ත අසරණ සත්ත්වයන්ට උදව් කරනවා Long Long නම් බල්ලා දිගු ශරීරයක් ඇති ඉතා වේගයෙන් දුර ධාවනයට දක්ෂයෙක්.

දිනක් සවස ගමේ ලාම්පු පහන් දල්වමින් සිටියදී ගමේ කුඩා දරුවෙක් අතුරුදන් වුණා. ඔහුගේ නම ලීවෙයි ඔහු නදිය අසල ක්‍රීඩා කරමින් සිටියදී මාර්ගය වැරදිලා වනයට ගොස් තිබුණා ගමේ මිනිසුන් බියට පත්වුණා ඔවුන් වහාම ලී වෙයි සෙවීම ආරම්භ කළා එවිට Xiao Hei **සහ** උගේ බල්ලන් කණ්ඩායම ඉදිරියට පැමිණියා

Xiao Hei නාසයෙන් ඉව බලා මාගර්ය සොයාගත්තා **Long Long** වේගයෙන් ඉදිරියට දුවමින් පාර පරීක්ෂා කළාග Lan Lan අවට පරිසරය හොඳින් නිරීක්ෂණය කරමින් අවදානම් සලකා බැලුවා Mei Mei සහ Bai Bai, ලී වෙයි බියට පත්වුණොත් සන්සුන් කරන්න සූදානම්ව හිටියා Huang Huang සහ Duo Duo පසුපසින් ආරක්ෂාව සැපයුවා

ටික වේලවකින් පසු එම සුනක කණ්ඩායම අතරමන් විය නමුත් ඔවුන් අවේ කුමක් කරනේදැයි ඔවුන්ට මතක තිබිනි එම කණ්ඩායම තමන්ගේ දක්ශතා අනුව එම කැලයෙන් එළියට යමට ලියොව සොයා ගැනීමට උත්සහ කලහග

එම සුනකයින් කණ්ඩායමට රාත්‍රි වන බවක් දැනුනි ලීවෙයි කොහෙ සිටීදැයි ඔවුන්ට සෙවීමට නොහැකි වියග ඔවුන් රාත්‍රිය ගත කිරීම සදහා ගසක් යට තිබි පුන්චි පැල්පතක් සොයා ගත්හ උදැසනින්ම රැලේ නායකයා වූ xiao hei අවදී වුනෙ එම කැලයෙන් පුන්චි ලමයෙක් අඩන ශබ්දයක් ඌට ඇහුන නිසා xiao hei රැලේ අනිත් සාමාජිකයයන් අවදි කරමින් ඉක්මනින් එම

ශබ්දය ඇසුනු තැනට ගොසිමින් සිටියදි පුන්චි ලමයෙක් අඩමින් සිටියේ ය ඒ සිටින්නේ ලිවෙයි බව සුනකයින් කන්ඩායම වටහ ගත්තේය ඔහු බය වී තිබුණා Xiao Hei ඔහු අසලට ගොස් බුරමින් ශබ්ද කළා Mei Mei ඔහු අසලට ඇවිත් ආදරයෙන් ඔහු සන්සුන් කළාග Duo Duo කුඩා හැසිරී මකින් ඔහුට හිනාවක් ගෙනාවා ගත්තාම සුනකයින් කණ්ඩායමට ගම බලා පිටත් වීමට අපහසු විය උදැසන කාලගුන ත්ත්වය සීතලව තිබූ නිස ලීවියිට අපහසු විය huanගg නිර්ත බල්ලෙක්ග ඌ ලග පාත තබු නිවසක් සොය ගෙන එම නිවසේ සිටි අයිතෛකාරයගේ නිවස අසලට පැමින බිරුවේයග මින් මහත දොර අරිනවාත් සමග ලස්සන බල්ලෙක් දෞවුවෙයග ඌ උදව්වක් අවශ්ය බල්ලෙක් බව මින් කමහතාට වැටහුනාග එම සුනකයා පසුපස දිවූ මින් මහතා පුදුම වුනග එතන සුනකයින් 7 දෙනෙක් සහ තවත් පුන්චි ලමයෙක් සිටි නිසග මින් මහතා හරි කරුනාවන්තයිග නමුත් ඔහුගෙ නිවසේ සිටියේ මින් මහතා පමනයිග ඔහු එම සුනකයින් හ පුන්චි ලමයා නිවසට රැගෙන ආවේයග ඔහු පුලුවන් පමනින් සුනකින්ට හා ලමයාට සැලකුවේයග ඉන්පසු මින් මහතා ලීවෙයිගෙන් විස්තර ඇසුවේයග

ලීවෙයි මෙසේ සියල්ල මින් මහතාට කිව්වෙය මින් මහතත් මේ සුනක කන්ඩායම අගය කලේය ඉන්පසු ලිවෙඉ ගම  ලියන්හූ කිවේය මින් මහත ලියන්හූ නම් ගමට මීට කලින් ගොස් තිබූ නිසා මාගර්ය ලාවට මතක් වුනි සුඅක කන්ඩායමේ සිටි සුනකයින්ගේත් උපකාරයෙන් නැවතත් ලියන්හූ වලට යාමට ඔවුන්ට හැකි වුනි ලීවෙයිගේ මව්පියන් කදුලු සැලුහ ගමේ මිනිසුන් මින් මහතා සහ සුනක කන්ඩායම ප්රශන්සනීයට ලක් කලේය එදා ගමේ මිනිසුන් මේ වීරකම නිසා ඒ සුනකයින්ව . ගමේ වීරයින් .ලෙස නම් කලහ ලීවෙයි මේ සුනක කන්ඩායමයට ස්තූති කර රසවත් ආහර ලබා දුන්නේයග එම සුනකයින්ගේ අයිතිකරු වූ වෙන්මින් මහතව සුනකයින් බදා ගත්හ ඉන්පසු ඔවුන් සතුටින් ජීවත් විය

**උගත් පාඩමථ** එකමුතු වීමේ බලය අතිශයින් විශාලයි මිතුරන් එකට සිටින විට කිසිදු අභියෝගයක් අසීරු නොවේ 🐾

පසුවදන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බොහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සම්බඳ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)